# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1881/41 - 2014 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා - 2014.09.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/14/25/2006

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.06.07 දිනැති හා අංක 1657/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.06.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අම්පාර ශ්‍රී ලංගම ටයර් කම්හල, භාරකාර ඉංජිනේරු, ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.07.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල් යූ. විජයවීර,
*වැ.බ.* - කම්කරු කොමසාරිස්.

2014 සැප්තැම්බර් මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර මයා,
භාරකාර ඉංජිනේරු,
ශ්‍රී ලංගම ටයර් කම්හල,
අම්පාර.

*ඉල්ලුම්කරු*

නඩු අංකය : ඒ/3448

එදිරිව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

*වගඋත්තරකරු*

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2012.05.25 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

මෙම නඩුවේ විසඳීමට ඇති ප්‍රශ්නය වන්නේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ පාලනය වන අම්පාර ටයර් කම්හලෙහි III - A ශ්‍රේණියේ භාරකාර ඉංජිනේරු වශයෙන් 2004.10.20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ආවරණ පත්වීමක් ලැබූ ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර යන අයට එම තනතුරෙහි ස්ථිර සේවය ලබා නොදීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව ද වේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

දෙපාර්ශ්වය විසින්ම ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් පසු නඩුව විමසීම සඳහා නියම කර මා ඉදිරියට පැමිණි අවස්ථාවේ මෙම නඩුව සමථය කිරීමට හැකියාවක් තිබේදැයි සලකා බලන ලද නමුත්, සමථයට පත් කිරීමට නොහැකි වූයෙන් විමසීමට නියම කර සාක්ෂි මෙහෙයවන ලදී.

පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත කේ. කේ. උපසේන පෙනී සිටි අතර, දෙවන පාර්ශ්වය වෙනුවෙන් සහකාර නීති නිලධාරි නිමාෂා අයන්ති මිය සමග රජයේ නීතිඥ ඩයනා කොඩිතුවක්කු මෙනෙවිය පෙනී සිටින ලදී,

දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි සහ ලේඛන ද, ලිඛිත දේශනද මා විසින් පරීක්ෂා කර බලන ලදී.

මෙහි පහත ඇතැම් තැනක පළමු පක්ෂය ලෙස හඳුන්වනු ලබන පැමිණිලිකාර ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර නමැත්තා vi වන ශ්‍රේණියේ සේවකයකු ලෙස මෙහි පහත ඇතැම් තැනක දෙවන පාර්ශ්වය යනුවෙන් හඳුන්වනු ලබන වගඋත්තරකාර පක්ෂය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කර ඇති බවත්, මේ අතරතුර සේවයේ අවශ්‍යතාවය මත දෙවන පක්ෂය විසින් 2004.10.20 වැනි දිනැති ලිපිය මගින් භාරකාර ඉංජිනේරු තනතුරක වැඩ ආවරණය කිරීම සඳහා පත්වීමක් ලබා දී ඇති බවත්, එතැන් පටන් මේ දක්වා ඔහු එම තනතුරේ වැඩ බැලීමේ රාජකාරි කරන බවත්, තනතුර ස්ථිර කර දෙන ලෙසට කීප විටක්ම ඉල්ලා සිටි නමුත්, කිසිදු පියවරක් දෙවන පාර්ශ්වය විසින් ගෙන නොමැති බවත්, කියමින් ඔහු භාරකාර ඉංජිනේරු තනතුරේ ස්ථිර කර පත්වීම් ලිපියක් ලබා දෙන ලෙසත්, III - A වන ශ්‍රේණියට පත් කරමින් පසු පඩි සමග එකී තනතුරේ පිහිටුවන ලෙසත් ඉල්ලා ඇත.

පළමු පක්ෂය විසින් මේ සම්බන්ධයෙන් ආයතනයේ කළමනාකාරිත්වයට නිරන්තර ඉල්ලීම් හා අභියාචනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කම්කරු කොමසාරිස්තුමා වෙත පැමිණිලි කිරීම හේතුවෙන් 2008.11.05 වැනි දින මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සාකච්ඡා කර නිර්දේශයක් ලබාදී ඇත. පැ/10 ලෙස ලකුණු කර ඇති 2008.11.05 වැනි දිනැති ලේඛනයට අනුව දෙවන පාර්ශ්වය විසින් මේ ආකාරයෙන් ආවරණය පත්වීම් ලබාදී ඇති එස්. ආර්. ඒකනායක, කමනි බාලසූරිය හා චන්ද්‍රාවතී යන සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දී ඇති බව ආයතනය පිළිගෙන ඇති බවත්, එමෙන්ම එහිදී මෙම පළමු පක්ෂය ඉල්ලා සිටින පරිදි III - A ශ්‍රේණියේ පිහිටුවීමට එකඟතාවය පල කර ඇති බවත්, පෙනී යන අතර, එකී එකඟතාවයට අනුව දින 30 ක් ඇතුළත මෙම ආරවුල සමථයට පත් කර ගැනීමට නිර්දේශ කර ඇති නමුත්, එකී නිර්දේශ ඉටු නොකිරීම හේතුවෙන් නඩු අංක ඒ/3336 යටතේ බේරුම්කරණය සඳහා නීතිඥ වී. අයි. ජයසූරිය මහතා වෙත යොමු කර ඇති අතර, 2010.06.03 වැනි දින නඩුව ආරම්භ කර ඇති අතර 2011.02.14 වැනි දින දෙවන පාර්ශ්වය වෙනුවෙන් දන්වා ඇත්තේ මේ සම්බන්ධයෙන් සමථයක් ඇති කර ගැනීමට දැනටමත් දෙවන පක්ෂය විසින් කටයුතු කර ඇත බවත්, III වැනි ශ්‍රේණිය හා සම්බන්ධ තනතුරක් ලබා දීමට සාමාන්‍යාධිකාරී කාර්මික දැනටමත් අනුමැතිය ලබා දී ඇති බවත්, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට හා විධායකතුමාගේ අවසන් නිර්දේශය ලබා ගැනීමට ඇති බවත්, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට හා විධායකතුමාගේ අවසන් නිර්දේශය ලබා ගැනීමට පමණක් ඇති හෙයින් සති 02 ක කාලයක් තුළ මෙය ලබා දීමට හැකි බවට පවසා ඇති බවත්, සටහන් අනුව පෙනී යයි. එකී සමථය ක්‍රියාත්මක වී නැත. වී. අයි. ජයසූරිය මහතාගේ අභාවයෙන් පසු මෙම බේරුම්කරණය සඳහා 2012.05.25 වැනි දින සිට නඩු අංක ඒ/3448 යටතේ නැවත මා වෙත යොමු කර ඇත.

මෙම නඩුවට ඉදිරිපත් වී ඇති සාක්ෂි සලකා බැලීමේදී 2004.10.20 වැනි දින සිට සේවයේ අවශ්‍යතාවය මත භාරකාර ඉංජිනේරු තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා ආවරණ පත්වීමක් පළමු පක්ෂයට ලබා දී ඇති බවත්, මේ දක්වාම පළමු පක්ෂය එසේ සේවයේ යෙදී සිටින බවත් දෙවන පක්ෂය පිළිගෙන ඇත. 2008.11.05 වැනි දින කම්කරු කොමසාරිස් කාර්යාලයේ පරීක්ෂණයක් පවත්වන ලද බවත්, එහිදී දෙවන පක්ෂය වෙනුවෙන් පෙනී සිටි නියෝජිත III - A ශ්‍රේණිය ලබා දීමට එකඟ වී ඇති බවත් හා ශ්‍රී ලංගම ආවරණ පත්වීම ලබා දී ඇත. වෙනත් අයට මෙවැනි උසස්වීම් ලබා දී ඇති බවට පිළිගෙන ඇති බවටත්, ඉදිරිපත් කර ඇති සාක්ෂි දෙවන පක්ෂය ප්‍රතික්ෂේප කර නැත. ඉහත කී ඒ/3448 දරණ නඩුවේ 2011.02.14 වැනි දින කාර්ය සටහන්වල සඳහන් කර ඇති සමථ යෝජනාව සම්බන්ධයෙන්ද දෙවන පක්ෂය මෙම නඩුවේදී ප්‍රතික්ෂේප කර නැත. එමෙන්ම මෙම නඩුවේදී නැවත වරක් මෙම සමථය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර, 2012.09.27 වැනි දින සටහන් අනුව දෙවන පාර්ශ්වය විසින් මෙම තැනැත්තාට iv වන ශ්‍රේණියට පසු පඩි රහිතව උසස්වීමක් ලබා දීමට එකඟතාවය පල කර ඇත. නමුත් iv වන ශ්‍රේණියේ පිහිටුවා පසු පඩි ලබා නොදීමට III වැනි ශ්‍රේණිය ලබා දීමට නොහැකි වීමට හෝ ඇති කිසිදු හේතුවක් දක්වා නොමැත.

දෙවන පාර්ශ්වය විසින් කරන ලද ඉහත සඳහන් පිළිගැනීම් තුළින් මෙම සේවකයා 2004.10.20 වැනි දින සිට සේවයේ අවශ්‍යතාවය මත භාරකාර ඉංජිනේරු තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා පත් කර ඇති බවත්, මේ දක්වා සේවය කරන බවත්, දෙවන පාර්ශ්වය විසින් වරෙක III වන ශ්‍රේණිය ලබා දීමටත්, තවත් වරෙක iv වන ශ්‍රේණිය ලබා දීමටත්, එකඟතාවය ලබා දී ඇති බවත්, සාක්ෂි මගින් තහවුරු වේ. මෙහිදී බේරුම්කරණයට විසඳීමට ඉතිරිව ඇත්තේ පළමු පක්ෂය ලෙස හඳුන්වන අගතියට පත් සේවකට III - A ශ්‍රේණිය ලබා දීම යුක්තිසහගත ද නැතහොත් iv වන ශ්‍රේණිය ලබාදීම යුක්තිසහගතද යන්න සලකා බැලීමයි.

සේවක 2004.10.20 වැනි දින සිට සේවයේ අවශ්‍යතාවය මත භාරකාර ඉංජිනේරු තනතුරේ සේවය කර ඇත. ඒ අනුව මේ වන විට වසර 09 ක් ඉක්ම වූ කාලයක් එකී තනතුරේ සේවය කර ඇත. සේවක තම තනතුර යථාවත් කර ගැනීම සඳහා නිරන්තර ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. පැ/10 ලේඛනයට අනුව මෙම නිලධාරියාට චෙක්පත් අත්සන් කිරීම, වවුචර් අත්සන් කිරීම ආදියට බලය ලබාදී ඇති බවත්, එකී කාර්යයන් III - A ශ්‍රේණියේ තනතුරක කාර්යයන් බවත්, ආයතනය වන දෙවන පක්ෂය විසින් පිළිගෙන ඇත. එකී සාක්ෂි අභියෝගයට ලක් කර නොමැති නිසා එම සාක්ෂි පිළිගැනීමට තීරණය කරමි. වැඩ බැලීම සම්බන්ධව සේවක තැනට කිසිදු දීමනාවක් ලබාදී නොමැත. තවද මෙම ආවරණ කාලය තුළ සේවකට විනය විරෝධී හෝ රාජකාරී අතපසුවීමක් හෝ සම්බන්ධව දඬුවම් ලබා දී ඇති බවට කිසිම සාක්ෂියක් ඉදිරිපත් වී නොමැත. තවද මෙම ඉල්ලීම සම්බන්ධයෙන් ආයතනයට කරන ලද ඉල්ලීම හේතුවෙන් පෞද්ගලික ලිපි ගොනුව 2007 වසරේ සිට ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගැනීම හේතුවෙන් ඔහුට vi වෙනි ශ්‍රේණියට හිමි වැටුප් වර්ධකය පවා මේ දක්වා ලැබී නැති බව කියා ඇත.

පළමු පාර්ශ්වය විසින් තමාගේ ඉල්ලීම සම්බන්ධයෙන් නිසි පියවර ගෙන ඇත. දෙවන පාර්ශ්වය ඒ සම්බන්ධයෙන් ඍජු පිළිවෙතක් අනුගමනය කර තීරණයක් ලබා දී නැත. නමුත් ඔවුන් විසින් ප්‍රශ්නය මග හැරීමේ ක්‍රියා පිළිවෙතක් හිතාමතාම අනුගමනය කර ඇති බව පෙනී යයි. වසර නවයකට අධික කාලයක් මෙම පුරප්පාඩුව පිරවීම සඳහා කටයුතු කර නැත. වසර නවයක් ඉක්ම වූ කාලයක් එකී තනතුරේ රැඳී සිටීමට අවස්ථාව ලබා දීම තුළින් පෙනී යන්නේ ආයතනය ඔහු මෙම තනතුරට සුදුස්සෙක් බව පිළිගෙන ඇති බවයි.

1987 ඔක්තෝබර් 01 වැනි දිනෙන් යුතුව නිකුත් කර ඇති 1987 මාර්තු 27 වැනි දින පැවති පස් වෙනි මණ්ඩලීය රැස්වීමේදී මණ්ඩලය විසින් වරින් වර සංශෝධනය කරන ලද විනය ව්‍යවස්ථාවක් අවසාන වශයෙන් ඇතුළත් කරන ලදි යනුවෙන් සටහන් කර ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාවේ 28 වන පිටුවේ 26 වැනි වගන්තියේ අර්ථ නිරූපනයන් යටතේ 263 අනු වගන්තියේ මෙසේ සඳහන් වේ.

"යම් ශ්‍රේණියක හෝ පන්තියක වැඩ බලන හෝ වැඩ ආවරණය කරන නිලධාරියෙකු හෝ සේවකයෙකු එම ශ්‍රේණියට හෝ පන්තියට අයත් නිලධාරියෙකු හෝ සේවකයෙකු වශයෙන් සළකනු ලැබේ". මේ වගන්තිය කෙරේද අවධානය යොමු කරමි.

ඉහත සඳහන් කරන ලද අංක ඒ/3336 දරන බේරුම්කරණය නඩුවේදී හා මෙම නඩුවේදී ද, කම්කරු කොමසාරිස් ඉදිරියේදී ද, මෙම ආරවුල සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් සේවකයාට III - A ශ්‍රේණිය ලබා දීම සඳහා එකගතාවය පලකර තිබීම සැලකිල්ලට ගනිමි. මෙම නඩුවේදී III - A ශ්‍රේණිය ලබාදීමට එකගතාවයක් නොදැක්වූවද එය සාධාරණීකරණය කිරීම සඳහා පිළිගත හැකි සාධක ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශ්වය අපොහොසත් වී ඇත.

සියළු කරුණු සැලකිල්ලට ගැනීමේදී 2004 වසරේ සිට මේ දක්වා වැඩ බැලීමේ තනතුරේ වසර නවයකට අධික කාලයක් සේවකයා තබා තිබීම හේතුවෙන් ඔහුට කිසියම් අසාධාරණයක් සිදු වී ඇති බව පැහැදිලි වේ.

සියළුම සාක්ෂි සමස්තයක් වශයෙන් ගෙන විශ්ලේෂනය කිරීමේදී පළමු පාර්ශ්වය වන සේවක තැනට III - A ශ්‍රේණිය ලබාදීම යුක්තිසහගත හා සාධාරණ බවට නිගමනය කරමි.

ඒ අනුව සේවක තැන III - A ශ්‍රේණියට පත් කිරීමට නියෝග කරමි. පළමු පාර්ශ්වය වන සේවක එකී ශ්‍රේණියට කුමන දිනක සිට පත් කල යුතු ද හා ඔහුට හිමි වැටුප් වර්ධක සම්බන්ධයෙන් සලකා බලමි.

මෙම ආරවුල අංක IR/14/25/2006 යටතේ මා වෙත යොමු කර ඇති 2012.05.25 වැනි දිනය එකී තනතුරට පත් කිරීමේදී දිනය වශයෙන් සැලකීමට තීරණය කරමි.

මෙම නඩුවේ සාක්ෂි සටහන්වල සේවක විසින් III - A ශ්‍රේණියේ මූලික වැටුප රු. 14,000/- ක් බවට කර ඇති ප්‍රකාශයත්, දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංගම විසින් නිකුත් කර ඇති මෙම නඩුවට ගොනු කර ඇති වැටුප් පරිමාණ දක්වන ලේඛනයේ සඳහන් සංඛ්‍යාවන් වැටුප ගණනය කිරීමේදී උපයෝගී කර ගන්නා ලදී.

ඒ අනුව පළමු පක්ෂය III - A ශ්‍රේණියට පත් කරනු ලබන දිනය 2012.05.25 වැනි දින විය යුතු බවත්, වැටුප් පියවර රු. 14,000/- ක් බවත්, දෙවන පියවර වශයෙන් 2013.05.25 වැනි දිනට රු. 14,360/- ක් ද, තෙවන පියවර වශයෙන් 2014.05.25 වැනි දිනට රු. 14,630/- ද වශයෙන් වැටුප් වර්ධක ලබාදිය යුතු බවත්, මින් ඉදිරියට ඔහුගේ වැටුප් වර්ධකය සෑම වසරකම මැයි මස 25 වන දින විය යුතු බවද මෙයින් නිගමනය කරමි.

මෙම නඩුවේදී මූලික වශයෙන් සමථයක් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අවස්ථාවේදී III - A ශ්‍රේණිය ලබා දී නියමිත වැටුප් තලයේ පිහිටුවන්නේ නම් ආයතනයේ ඇති ආර්ථික දුෂ්කරතාවය හේතු කොට ගෙන පසු පඩි නොමැතිව සමථයකට පත් වීමට පළමු පක්ෂය එකඟ වී ඇති හෙයින්, පසු පඩි ලබා දීමට තීරණය නොකරමි. ඒ අනුව 2012.05.25 වැනි දින සිට 2014.05.25 වැනි දින දක්වා කාලය සඳහා හිඟ පඩි ලබාදීමක් නොකරමි.

මෙම නියෝගය ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර දින 30 ක් ඉක්මවීමට ප්‍රථම දෙවන පක්ෂය විසින් පළමු පක්ෂය වන ඒ. ජී. පී. ඩී. ඉන්ද්‍රසේකර යන අය ඉහත නියෝගයේ සඳහන් ආකාරයට III - A ශ්‍රේණියට පත් කොට නියමිත වැටුප් තලයේ තැබිය යුතු බවට තවදුරටත් මෙයින් නියෝග කරනු ලැබේ.

මෙය යුක්තිසහගත හා සාධාරණ ප්‍රදානයක් බවට නිගමනය කරමි.

එන්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

2014.07.24

10-487

මගේ අංකය : IR/22/26/2009

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.01.03 වැනි දිනැති හා අංක 1739/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2011.12.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බණ්ඩාරවෙල, ඇටම්පිටිය පාර, "රංජුලා", අංක 70 හි පදිංචි මංගල කාන්ති රත්නායක මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.08.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල් යූ. විජයවීර,
*වැ.බ.* - කම්කරු කොමසාරිස්.

2014 සැප්තැම්බර් මස 14 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

මංගල කාන්ති රත්නායක මිය,
අංක 70, "රංජුලා",
ඇටම්පිටිය පාර,
බණ්ඩාරවෙල.

*ඉල්ලුම්කාරිය*

නඩු අංකය : ඒ/3429 **එදිරිව**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුල පාර,
කොළඹ 05.

*වගඋත්තරකරු*

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2011.12.23 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති ආරවුල වන්නේ :-

01. "කිසිදු යුක්තිසහගත, සාධාරණ හෝ විනයානුකූල හේතු නොමැතිව බණ්ඩාරවෙල ඩිපෝවේ vi ශ්‍රේණියේ පොත් තැබුම්කරු ලෙස සේවය කරමින් සිටියදී මංගල කාන්ති රත්නායක වන මෙම පැමිණිලිකාරිය බිබිල ඩිපෝවට 1998.01.26 වැනි දින සිට ස්ථාන මාරු කිරීම යන්න

හා

02. 1998 මාර්තු මස සිට 2002 ජූලි මාසය දක්වා කාලය සඳහා ඇයට හිමි වැටුප් වර්ධක සමග හිඟ වැටුප් නොගෙවීම සමග ඇයගේ අඛණ්ඩ සේවා කාලය තහවුරු කිරීම යන්න" පිළිබඳව වේ යන කරුණු දෙක වේ.

පාර්ශ්වකරුවන් විසින් ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් පසු මෙම නඩුව විමසීමට ගත් අතර, පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත එස්. බී, දයානන්ද පෙනී සිටි අතර, දෙවන පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ නීති නිලධාරිනී නිමාෂා අයන්ති මෙනෙවිය සමග රජයේ නීතිඥ තවීෂා ජයසිංහ මහත්මිය පෙනී සිටිමින් නඩු විභාගය පවත්වා පළමු පක්ෂය විසින් පැ/01 සිට පැ/49 දක්වා ලේඛන ද දෙවන පක්ෂය විසින් R/01 සිට R/38 දක්වා ලේඛන ද ලකුණු කරමින් සාක්ෂි අවසන් කර ඇත. දෙපාර්ශ්වයම විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලේඛනද, ලිඛිත දේශන ද මා විසින් පරීක්ෂා කර බලන ලදී.

පළමු පාර්ශ්වය විසින් කියා සිටින්නේ, ඇය 1978 වර්ෂයේද ඌව ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය යටතේ සේවයට බැඳුණු බවත්, 1991.07.07 වැනි දින සිට ස්ථාපනය කරනු ලැබූ සී/ස. බණ්ඩාරවෙල ජනතා සන්තක ප්‍රවාහන සේවයට අනුයුක්ත කිරීමෙන් අනතුරුව, එම සමාගම යටතේ නව පත්වීමක් ලැබ පොත් තැබුම්කාරියක ලෙස සේවය කරන ලද බවත්, 1997.11.18 වැනි දින සිට සී/ස. ඌව බස් සමාගම පිහිටුවීමෙන් පසු එකී සමාගමට අයත් බණ්ඩාරවෙල ඩිපෝවේ සේවය කරමින් සිටියදී සේවයේ අවශ්‍යතාවයක් නොමැතිව 1998 ජනවාරි 26 වැනි දින සිට බිබිල ඩිපෝවට ස්ථාන මාරු කරන ලද බවත්, එසේ කරන ලද්දේ පලිගැනීමේ අරමුණින් බවත්, එකී මාරුවට අනුව බිබිල ඩිපෝවට ගොස් සේවයට වාර්තා කර නැවතීමට නේවාසික ස්ථානයක් සොයමින් සිටිය දී නැවත බිබිල ඩිපෝවට සේවයට වාර්තා නොකරන ලෙසට මැර කණ්ඩායමක් විසින් ඇයට තර්ජනය කරන ලද බවත්, ඒ සම්බන්ධයෙන් ඇය පොලීසියට පැමිණිලි කල බවත්, ඉන් පසු බිබිල ඩිපෝවට සේවයට වාර්තා නොකර, ඒ සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන්ට ලිඛිතව දැන්වූ බවත්, හා කම්කරු කොමසාරිස්තුමාටද පැමිණිලි කල බවත්, ඒ අනුව ඇය නැවත බණ්ඩාරවෙල ඩිපෝවට මාරු කරන ලෙසට, කම්කරු කොමසාරිස් විසින් නියෝග කරනු ලැබූවද, එසේ නොකල බවත්, ඉල්ලුම්කාරියගේ කිසිදු ඉල්ලීමක් නොමැතිව සේවා යෝජක විසින් ඇය බදුල්ල ඩිපෝවට ස්ථාන මාරු කරන ලද නමුත්, ඇය බණ්ඩාරවෙල ඩිපෝවට මාරු කරන ලෙස නැවත නැවතත් ඉල්ලීම් කරන ලද මුත්, ඒ සම්බන්ධයෙන් සේවා යෝජක කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන ලද බවත්, ඒ අනුව අනුමිත ලෙස සේවයෙන් පහ කිරීම මත බදුල්ල කම්කරු විනිශ්චය සභාවේ නඩු පැවරූ බවත්, එකී නඩුව පවතින අතර, ඇය විසින් ප්‍රවාහන ඇමතිතුමා වෙත කරන ලද ඉල්ලීමක් අනුව ඇය නැවත සේවයට කැඳවීම හේතු කොට ගෙන නඩුවේදී එළඹී සමථය අනුව ඇය විසින් ඉල්ලා ඇති අනෙකුත් සහනයන්ට අගතියක් නොවන පරිදි නඩුව ඉදිරියට ගොස් තීරණයක්

ලබාගැනීමට එකඟව 2002.07.18 වැනි දින බණ්ඩාරවෙල ඩිපෝවේ සේවයට වාර්තා කල බවත්, අනතුරුව වැඩිදුර විභාගය සඳහා නඩුව කැඳවූ අවස්ථාවේ සේවා සමාප්තියක් නොමැතිව නඩුව ඉදිරියට යාමට නොහැකි බවට විරෝධතාවක් ඉදිරිපත් කිරීම මත 2007.06.07 වැනි දින ඉල්ලුම්කාරියට අනෙකුත් අයිතීන් සම්බන්ධව නිසි පර්ෂදයකට යාමේ අයිතියට අගතියක් නොවන පරිදි ඉල්ලුම් පත්‍රය නිෂ්ප්‍රභා කල බවත්, ඒ අනුව, 2007.07.07 වැනි දින හපුතලේ කම්කරු කොමසාරිස් වෙත පැමිණිලි කල නමුත්, ආයතනයෙන් නොපැමිණීම මත නිගමනයකට පැමිණීමට නොහැකි වූ බවත්, ඒ අනුව ඇයගේ ස්ථාන මාරුව යුක්තිසහගත නොවන බවත්, මෙම ආරවුල කාර්මික සම්බන්ධතා අංශයට යොමු කල බවත්ය. ඒ අනුව ඇයට 1998 මාර්තු මස සිට 2002.07.18 වැනි දින දක්වා වැටුප් වර්ධක සමග ඇයට හිමි පසු පඩි ලබා දෙන ලෙසත්, අඛණ්ඩ සේවය තහවුරු කර දෙන ලෙසත් හා සිත් තැවුල් හා නඩුව සම්බන්ධයෙන් වැය වී ඇති මුදලුත් සැලකිල්ලට ගෙන වන්දි මුදලක්ද ලබා දෙන ලෙස ඉල්ලා සිටී.

මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ සේවා අවශ්‍යතාවය මත 1998.01.06 වැනි දින සිට බිබිල ඩිපෝවට මාරු කරන ලද බවත්, 1998.03.14 වැනි දින දක්වා සේවයට වාර්තා නොකරමින් විදුලි පුවත් හා ලිපි එවමින් සිටි බවත්, 1998.01.28 වැනි දින බිබිල ඩිපෝවට සේවයට වාර්තා කිරීමට ගොස් සිටියදී සේවා නිමාවෙන් පසු ඇයට සිදු වූවා යැයි කියන තර්ජන සම්බන්ධයෙන් ආයතනයට වාර්තා වී නැති බවත්, පැමිණිලිකාරියගේ 1998.02.24 වැනි දිනැති අභියාචනය සැලකිල්ලට ගෙන 1998.03.05 වැනි දිනැති ලිපිය අනුව වහාම බලපැවැත්වෙන පරිදි ඇයගේ නිවසට ආසන්න සේවා ස්ථානයක් වන බදුල්ල අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක කාර්යාලයට ස්ථාන මාරු කර යැවූ බවත්, ඇය දිගින් දිගටම ඇයට සිදු වන තර්ජන ගැන දක්වමින් සේවයට වාර්තා නොකර සිටීම මත සේවය අතහැර ගිය අයෙකු සේ සලකා ක්‍රියාකර ඇති බවත්ය.

තවද, මෙම පැමිණිලිකාරියට සේවයට වාර්තා කිරීම සඳහා සෑහෙන කාල පරාසයක් ලබා දී ඇතත්, සේවයට වාර්තා නොකර තිබියදීත්, පැමිණිලිකාරිය විසින් නැවත රැකියාව ලබාදෙන ලෙසට කරන ලද අභියාචනා සැලකිල්ලට ගෙන 2002.02.07 වැනි දිනැති ලිපියෙන් vi වැනි ශ්‍රේණියේ අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක නිලධාරි තනතුරෙහි නැවත සේවයේ පිහිටුවා ඇති බවත්, එම අවස්ථාව වන විට බණ්ඩාරවෙල කම්කරු විනිශ්චය සභාවේ නඩු අංක 30/1643/1998 යටතේ නඩුවක් විභාග වෙමින් තිබූ අතර, ඇය සේවයේ යෙදෙමින් සිටියදී සේවා සමාප්තියක් නොමැති හෙයින් මෙම නඩුව පවත්වා ගෙන යාමට නොහැකි බවට සේවායෝජකගේ ඉල්ලීම මත ඉල්ලුම්කාරියට හිමි අයිතීන් පිළිබඳව නිසි පර්ෂදයකට යාමේ අයිතියට අගතියක් නොවන පරිදි ඉල්ලුම් පත්‍රය නිෂ්ප්‍රභා කරන ලද බවත්, දෙපාර්ශ්වය විසින් එළඹී ඇති සමථය පරිදි ඉල්ලුම්කාරියගේ සේවයේ බණ්ඩනය වීමක් නොමැතිව සේවයේ යෙදෙන බවට සලකා ඉල්ලුම්කාරියගේ ව්‍යවස්ථාපිත දීමනාවලට මෙකී නියෝගයේ බලපෑමක් නොවන බවට තීරණය කර ඇති බව ද කියා සිටී. ඒ අනුව 1998 මාර්තු මස සිට 2002 ජුලි මස දක්වා හිඟ වැටුප් ගෙවීමට මණ්ඩලය බැඳී නොමැති බව ප්‍රකාශ කර සිටී.

ඉල්ලුම්කාරියට ලබා දී ඇති ස්ථාන මාරුව යුක්තිසහගතද යන්න සම්බන්ධයෙන් සලකා බලමි.

1998.01.26 වැනි දින දරන ලිපියෙන් ඉල්ලුම්කාරියට ස්ථාන මාරුවක් ලබා දී ඇත්තේ, සේවයේ අවශ්‍යතාවය මත යනුවෙන් සඳහන් කරමිනි. ඉල්ලුම්කාරියගේ ස්ථාවරය වන්නේ මෙම ස්ථාන මාරුව පලිගැනීමේ අදහසින් කරන ලද්දක් බවත්, ඇය බණ්ඩාරවෙල ඩිපෝවේ කොටස් හිමිකාරියක් වන හෙයින්, කොටස් හිමිකරුවන්ට ස්ථාන මාරු කිරීම් ලබා දිය නොහැකි බවත්ය.

ඉල්ලුම්කාරිය තම සාක්ෂිය පුරාම පලිගැනීමේ චේතනාවෙන් ඇයට මෙම ස්ථාන මාරුවීම ලබාදුන් බවත්, ඇයට මරණීය තර්ජන ඇති බැව් ප්‍රකාශ කරමින් දිගින් දිගටම ලිපි ඉදිරිපත් කර ඇති නමුත්, ඇගේ සාක්ෂියෙන් ප්‍රකාශ වී ඇති කරුණු තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී නොමැත.

කොටස් හිමිකාරිත්වය ලබාගෙන බණ්ඩාරවෙල සේවා ස්ථානයට අනුයුක්ත වීමට පෙර ඇය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් මුල් පත්වීම මත කරන ලද සේවා කාලය අවසන් කර අදාළ ව්‍යවස්ථාපිත දීමනා ලබා ඇති බවත්, බණ්ඩාරවෙල ඩිපෝවට නව පත්වීමක් ලද බවත්, ඒ අනුව කොටස් හිමිකරුවකු ස්ථාන මාරු කිරීමට නොහැකි බවත්, ප්‍රකාශ කර ඇත. පත්වීමේ ලිපිය පැ/03 ලෙස ලකුණු කර ඇත. එම පත්වීමේ ලිපියේ ස්ථාන මාරු කිරීමට ඇය යටත් බවට සටහනක් යොදා නොමැති බවට ඉල්ලුම්කාරිය කියා ඇති නමුත්, ඇය කොටස් හිමිකාරියක් වන හෙයින් ස්ථාන මාරු කල නොහැක යනුවෙන් ද කිසිදු වගන්තියක් නොමැත. ඉල්ලුම්කාරියගේ ස්ථාවරය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් වෙනත් සාක්ෂියක් හෝ ඉදිරිපත් කර නොමැත. වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති R/11 දරන ලේඛනයට අනුව ඌව බස් කම්පැණි ලිමිටඩ් සමාගම 1997 ක් වූ නොවැම්බර් මස 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සංස්ථාගත කිරීම හා නීතිගත කිරීම සිදු වී ඇති අතර, එකී සමාගමට ඩිපෝ 07 ක් එක් කර ඇති අතර, බණ්ඩාරවෙල, බිබිල හා බදුල්ල ඩිපෝද එයට ඇතුළත්ව ඇත. එමෙන්ම ජනතා සන්තක ප්‍රවාහන සේවා නීතිමය වශයෙන් ඇවර කර ඇති බව ද R/11 ලේඛනයේ ද සඳහන්ව ඇත.

ඇය පොත් තැබුම්කාරියක් බවට ප්‍රකාශ කරන නමුත්, ඇය අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක ලෙස කටයුතු කර ඇති බවට ද සාක්ෂි හා ලේඛන මගින් ඔප්පු වී ඇත.

ඒ අනුව බණ්ඩාරවෙල ඩිපෝවේ කොටස් හිමිකාරියක් වීම නිසා ස්ථාන මාරු කිරීමට නොහැකි බවට ඉල්ලුම්කාරිය කරන ප්‍රකාශය ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව තහවුරු කර නොමැත.

ඉහතින් සඳහන් සියලුම සාක්ෂි සමස්තයක් ලෙස සලකා බැලීමේදී ඉල්ලුම්කාරියගේ ස්ථාන මාරුව අයුක්ති සහගත බවට නිගමනය කල නොහැක.

02. 1998 මාර්තු මස සිට 2002 ජුලි මාස දක්වා කාලය සඳහා ඇයට හිමි වැටුප් වර්ධක සමග හිඟ වැටුප් නොගෙවීම සමග ඇයගේ අඛණ්ඩ සේවා කාලය තහවුරු කිරීම යන්න සම්බන්ධයෙන් සලකා බලමි.

කම්කරු විනිශ්චය සභා බණ්ඩාරවෙල නඩු අංක 35/1643/1998 දරන නඩුවේදී 2007.08.07 වැනි දිනැති නියෝගයෙන් ඉල්ලුම්කාරිය සේවයේ යෙදී සිටින හෙයින් කාර්මික ආරවුල පනතේ 31 ආ (1) වගන්තිය මගින් කම්කරු විනිශ්චය සභාවට ලැබෙන අධිකරණ

බලයක් නොලැබෙන හෙයින් මෙම නඩුව පවත්වා ගෙන යාමට අධිකරණ බලයක් නොමැතිවීමේ පදනම මත ඉල්ලුම්කාරියට හිමි අයිතීන් සම්බන්ධව නිසි පර්ෂදයකට යැමේ අයිතිය තබා එකී නඩුව නිෂ්ප්‍රභා කරමින් නියෝගයක් ලබාදී තිබුණත්, එකී නියෝගයේ අවසන් ඡේදයේ මෙසේ සඳහන් කර ඇත.

එනම්,

"තවද දෙපාර්ශ්වය විසින් එළඹි සමථය පරිදි ඉල්ලුම්කාරිය සේවයේ බණ්ඩනය වීමක් නොමැතිව සේවයේ යෙදෙන බවට සලකා මෙකී නියෝගය දානය කරනු ලබන හෙයින් ඉල්ලුම්කාරියට හිමි ව්‍යවස්ථාපිත අයිතීන්ට මෙකී නියෝගයේ බලපෑමක් නොමැති බැව්ද තීරණය කරමි."

මෙම නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර නොමැත. එම නිසා එකී නියෝගය බලාත්මකව පවතී. එමෙන්ම වගඋත්තරකරු මෙම නඩු වාර්තාවට ගොනු කර ඇති තම ප්‍රකාශයෙන් ද ඉහත නියෝගය පරිදි සේවා බණ්ඩනය වීමක් නොවන බව පිළිගෙන ඇත.

තවද, 2002.07.18 වැනි දින අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක ධූරයේ වැඩට වාර්තා අවස්ථාවේ වේතනය ගෙවා ඇත්තේ 1998 වර්ෂයේ සිට වාර්ෂික වේතන වැඩිවීම් සහ රජයෙන් වැඩි කරන ලද වේතන වැඩිවීම් ගෙවූ බවට සලකා වැටුප් පියවරක පිහිටුවා ඇති බව ඉල්ලුම්කාරිය වෙනුවෙන් පිළිගෙන ඇත.

ඉහත සඳහන් කරුණු සැළකිල්ලට ගැනීමේදී ඉල්ලුම්කාරියගේ සේවය බණ්ඩනය වීමක් සිදුවී නොමැති බවට තීරණය කරමි. එමෙන්ම ඇයට ව්‍යවස්ථාපිත දීමනා ලබා දීමේදී සේවය බණ්ඩනය වීමක් විය නොහැකි බවට ද නිගමනය කරමි.

ඉල්ලුම්කාරිය 1998.01.26 වැනි දින දරන ලිපිය මගින් බිබිල ඩිපෝවට ස්ථාන මාරු කර ඇති අතර, 1998.01.28 වැනි දින ඇය සේවයට වාර්තා කර ඇති බවත්, පසුව ඇය සහ ඇගේ ස්වාමිපුරුෂයා ඇයට නැවතීමට නවාතැනක් සොයමින් සිටියදී, මැර පිරිසක් පැමිණ තමන් සේවයට වාර්තා නොකරන ලෙසට ඇයට මරණීය තර්ජන එල්ල කල බවත්, ඒ අනුව පොලීසියට පැමිණිලි කල බවත්, ඉල්ලුම්කාරියට බිබිල ඩිපෝවට වාර්තා කිරීමට ඇති අපහසුතාවය සම්බන්ධයෙන් බිබිල ඩිපෝවට දැන්වූ බවත්, ඇයට බණ්ඩාරවෙල ඩිපෝවට මාරුවක් ලබාදෙන ලෙසට අභියාචනා ඉදිරිපත් කරන ලද බවත් ප්‍රකාශ කර ඇත. ඇයගේ අභියාචනය සලකා බලා බදුල්ල ඩිපෝවට ස්ථාන මාරුවක් 1998.03.13 වැනි දින දරන ලිපියෙන් ලබා දී ඇත. ඉල්ලුම්කාරියගේ ඉල්ලීම වූයේ බණ්ඩාරවෙල ඩිපෝවට මාරුවක් ලබාදෙන ලෙස වූ නිසාත්, ඇය බදුල්ල ඩිපෝව ඉල්ලා නොසිටි නිසාත්, ඇයට ආරක්ෂාව පිළිබඳ තර්ජනයක් තිබෙන නිසාත්, ඇය බදුල්ල ඩිපෝවේ සේවයට වාර්තා කිරීම ප්‍රතික්ෂේප කර ඇත. ඉන් අනතුරුව, බදුල්ල ඩිපෝව මගින් ඇයට සේවයට වාර්තා කරන ලෙසත්, කාර්යාලය තුළ ඇයට අන් සේවකයින්ට මෙන් ආරක්ෂාව ලබාදිය හැකි බවද දන්වා ඇත. දෙපාර්ශ්වය අතරේ මේ සම්බන්ධයෙන් දිගින් දිගටම ලිපි හුවමාරු වී ඇති බව ලේඛන මගින් පෙනී යයි. ඉල්ලුම්කාරිය විසින් බදුල්ල ඩිපෝවේ සේවයට වාර්තා නොකිරීම මත සේවයට වාර්තා නොකලහොත් සේවය අතහැර ගිය අයෙකු සේ සැලකීමට සිදුවන බව දන්වා එවා ඇති අතර, අනතුරුව සේවය අතහැර ගිය අයෙකු සේ සලකන බවට දන්වමින් 1998.09.28 වැනි දින දරන ලිපිය මගින් දන්වා ඇත.

ඉල්ලුම්කාරිය විසින් 1998.09.22 වැනි දින විසින් කම්කරු විනිශ්චය සභාව වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරමින් ඇයගේ සේවය අනුමිත ලෙස අවසන් කර ඇතිය යන පදනම මත සහන පතා ඇත. මෙම නඩුව පවතින අතරතුර ඉල්ලුම්කාරිය විසින් එවකට සිටි ප්‍රවාහන ඇමතිතුමාට නැවත රැකියාව ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව ආයතනය විසින් නැවත සේවය ලබා දී ඇති අතර, 2002.07.18 වැනි දින බණ්ඩාරවෙල ඩිපෝවේ අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක තනතුරේ වැඩ භාර ගෙන ඇත්තේ පසු පඩි සම්බන්ධයෙන් විසඳා ගැනීම සඳහා නඩුව ඉදිරියට ගෙන යාමේ අපේක්ෂාවෙනි. එහෙත් පසුව ඇය නැවත සේවය භාර ගැනීමත් සමග සේවය අවසන් කිරීමේ තත්ත්වයෙන් බැහැර වන හෙයින් කම්කරු විනිශ්චය සභාවට මෙම නඩුව විසඳීම සඳහා අධිකරණ බලයක් නොමැති හේතුව මත ඇයගේ හිමිකම් ලබා ගැනීම සඳහා වෙනත් පර්ෂදයකට යාමේ අයිතිය තබා 2007.06.07 වැනි දින එකී නඩුව නිෂ්ප්‍රභා කර ඇත.

ඉල්ලුම්කාරියට මරණීය තර්ජන තිබුණු බවට පවසමින් පොලීසියට කරන ලද පැමිණිල්ලක් හා සේවා යෝජකට යවන ලද ලිපි බොහොමයක් හා මානව හිමිකම් ආයතනයට හා කම්කරු කොමසාරිස්වරයාට යවන ලද ලිපිද මෙම පරීක්ෂණයේදී ඉදිරිපත් කර ඇත. ඉල්ලුම්කාරිය විසින් ඇයගේ සාක්ෂියෙන් හා ඇය විසින් ලියන ලද ලිපි මගින් ඇයට තර්ජන තිබූ බවට ප්‍රකාශ කරන ලද නමුත්, එකී කරුණු ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත.

එමෙන්ම ඉල්ලුම්කාරිය විසින් බණ්ඩාරවෙල ඩිපෝවට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ ඇයගේ ආරක්ෂාව පතා වන නමුත්, බණ්ඩාරවෙල ඩිපෝවේ නිලධාරීන් දෙදෙනෙක් අමානුෂික ලෙස ඝාතනයට ලක් වූ බවත්, තවත් අයෙකුට හිසට තදබල ලෙස පහර දුන් බවටත්, මරණ තර්ජන බණ්ඩාරවෙල ඩිපෝවේ තිබූ බවත්, ඇයගේම සාක්ෂියෙන් පිළිගෙන ඇත. එය කෙරෙහිද අවධානය යොමු කරමි.

තවද ඇයගේ අභියාචනය සලකා බලා බදුල්ල ඩිපෝවට ඇයට ස්ථාන මාරුවක් ලබා දෙන්නේ 1998.03.13 වැනි දින, මුල් මාරුවීමේ දිනය වන 1998.01.26 වැනි දින සිට මසකටත් වැඩි කාලයකට පසුවයි. ඇය එකී ලිපියට අවනත වී සේවයට වාර්තා කිරීමවත් අවම වශයෙන් කර නොමැත. සේවා යෝජක විසින් කරන ලද නියෝගය පිළිපැද එයට එරෙහිව පැමිණිලි කිරීම සාමාන්‍ය සම්ප්‍රදායයි. සේවා යෝජක ආයතනය විසින් ඇයට සේවයට වාර්තා කිරීම සඳහා 1998 සැප්තැම්බර් මස තෙක් අවස්ථාව ලබා දී ඇත. සේවයට වාර්තා කරන ලෙස නිරන්තර දැන්වීම් තිබියදී ඇය, අනුමිත ලෙස සේවය අවසන් කලා යැයි පදනම මත කම්කරු විනිශ්චය සභාවේ නඩු පවරා පවතින අතර ඇය විසින්ම ප්‍රවාහන ඇමතිතුමාට අභියාචනයක් ඉදිරිපත් කර නැවත රැකියාව ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව නැවත රැකියාව ලබාදීම අනුව සිය කැමැත්තෙන්ම 2002.07.18 වැනි දින සිට සේවයට වාර්තා කර ඇත.

ඉහත සඳහන් සියළු කරුණු සැළකිල්ලට ගෙන සලකා බැලීමේදී සේවා යෝජක ආයතනය ඇයට සේවයට වාර්තා කිරීම සඳහා සාධාරණ කාල පරාසයක් ලබා දෙමින් යුක්තිසහගත ලෙස කටයුතු කර ඇති බව පිළිගැනීම යුක්තිසහගත බවට නිගමනය කරමි. ඉල්ලුම්කාරිය ඇයගේ අභිමතය පරිදි 1998 මාර්තු මස සිට 2002 ජූලි මස දක්වා සේවයට වාර්තා කර නොමැති බව පැහැදිලි වේ.

සියලුම කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බලා පහත සඳහන් ලෙස නිගමනය කරමි.

01. ඉල්ලුම්කාරියගේ ස්ථාන මාරුව අයුක්තිසහගත බව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වී නොමැති හෙයින්, ස්ථාන මාරුව අයුක්තිසහගත බවට නිගමනය කල නොහැකි බවටත්,

02. ඇයගේ සේවය බණ්ඩනය වීමක් නොවිය යුතු බවටත්,

03. ඇයට 1998 මාර්තු මස සිට 2002 ජූලි මස දක්වා කාලය සඳහා ඇයට වැටුප් ලබාගැනීමට හිමිකමක් නොමැති බවටත්, නියෝග කරමි.

මෙය යුක්තිසහගත හා සාධාරණ ප්‍රදානයක් බවට නිගමනය කරමි.

එන්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

2014.08.21

10 - 488

---

මගේ අංකය : IR/10/65/2009

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.10.18 වැනි දිනැති හා අංක 1780/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.09.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අතුරුගිරිය, ගලබඩ වත්ත, අංක 252/2 හි පදිංචි නිරංජන් උඩුමලගල මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, කුමාරතුංග මුනිදාස මාවත, තැ.පෙ. 1490 හි පිහිටි කොළඹ විශ්ව විද්‍යාලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.08.26 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල් යූ. විජයවීර,
*වැ.බ.* - කම්කරු කොමසාරිස්.

2014 සැප්තැම්බර් මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

නිරංජන් උඩුමලගල මහතා,
අංක : 252/2, ගලබඩ වත්ත,
අතුරුගිරිය.

*ඉල්ලුම්කරු*

නඩු අංකය : ඒ/3480 **එදිරිව**

කොළඹ විශ්ව විද්‍යාලය,
තැ. පෙ. 1490,
කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03.

*වගඋත්තරකරු*

### ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2012.09.24 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ :-

"කොළඹ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ සේවයේ යොදවා ඇති නිරංජන් උඩුමලගල මහතා වෙත ලේඛකාධිකාරීගේ 2007.03.15 වැනි දාතම දරන ලිපිය මගින් 2007 වර්ෂය සඳහා උපයා ගත්තා වූ වාර්ෂික වැටුප් වර්ධකය විලම්භනය කිරීම හා 2008 හා 2009 යන වර්ෂවල උපයාගත් වැටුප් වර්ධකයන් ඔහුට නොදන්වා විලම්භනය කිරීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් සිදු වූයේද, එසේ අසාධාරණයක් සිදු වූයේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ."

02. කාර්මික ආරවුල් පනත යටතේ පනවා ඇති රෙගුලාසි යටතේ පාර්ශ්වයන්ගේ ප්‍රකාශ ලබාගෙන ඒවායේ පිටපතක් විවෘත අධිකරණය ඉදිරිපිටදී පාර්ශ්වයන් විසින් හුවමාරු කිරීමෙන් අනතුරුව විභාගය 2012.12.18 වැනි දින ආරම්භ කරන ලද අතර, ප්‍රථමයෙන් ඉල්ලුම්කාර පාර්ශවයේ සාක්ෂි මෙහෙයවන ලෙස මා නියෝග කිරීමෙන් පසු ඉල්ලුම්කරු නිරංජන් ගාමිණී උඩුමලගල මහතාගේ සාක්ෂිය මෙහෙයවීම ආරම්භ කරන ලදී.

03. පැමිණිලිකරුගේ මූලික සාක්ෂිය අනුව ඔහු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංක 2861 යටතේ ලියාපදිංචි වී ඖෂධ වේදියෙකු ලෙස 1991.11.01 වැනි දින සිට ඖෂධවේදී තනතුරේ සේවය කිරීම ආරම්භ කර ඇත. එම සාක්ෂියට පහත සඳහන් මූලික කරුණු ඇතුළත් ය.

(i) පැමිණිලිකරු 1989.05.08 වැනි දින සිට 1991.11.01 වැනි දින දක්වා ඖෂධවේදී පහළ ශ්‍රේණියේ සේවකයෙකු ලෙස පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සේවය කොට 1992.06.16 වැනි දින සිට කොළඹ විශ්ව විද්‍යාලයේ ඖෂධවේදී කටයුතු කිරීම ආරම්භ කර ඇත. මේ කාල සීමාව ඇතුළත ඔහුට විරුද්ධව කිසිම පැමිණිල්ලක් නොතිබුණි.

(ii) කොළඹ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී හුසේන් මහතා විසින් අත්සන් කරන ලද 2007.03.15 වැනි දිනැති ලිපියෙන් 2007.01.01 වැනි දිනට නියමිත වාර්ෂික වැටුප් වර්ධකය විලම්භනය කරන බව පැමිණිලිකරුට දන්වා ඇත. (පැ/03) එම ලිපියට පෙර ඉල්ලුම්කරුට විරුද්ධව කිසිම පරීක්ෂණයක් කර නැති අතර, මෙම ක්‍රියා මාර්ගය ගැනීම සම්බන්ධව කිසිදු ලිපියක් ද ලැබී නැත.

(iii) පසුව 2008 සහ 2009 යන වසර දෙකට අදාළ වැටුප් වර්ධක විලම්භනය කල බැවින් ඉල්ලුම්කරු මේ පිළිබඳව කොළඹ 05, කම්කරු කොමසාරිස් ජනරාල්වරියට පැමිණිලි කරන ලදී.

(iv) ඉන් අනතුරුව කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) කොළඹ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත ඔහුගේ 2010.04.06 වැනි දින දරන ලිපියෙන් පැමිණිලිකරුගේ 2007. 2008 සහ 2009 යන වර්ෂවල ඔහුගේ වැටුප් වර්ධක ලබා දී ඒ බව ඔහුට එනම්, කම්කරු කොමසාරිස් කාර්මික සම්බන්ධතා වෙත දන්වන ලෙස විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී දැනුම් දෙන ලදී.

(v) කොළඹ විශ්ව විද්‍යාලය එසේ කිරීමට අපොහොසත් වූ බැවින් කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ මෙම ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් මා පත් කරන ලදී.

04. වැටුප් විලම්භනය කිරීමට පෙර ඉල්ලුම්කරුට කිසිම දැන්වීමක් නොකර 2007, 2008 සහ 2009 යන වර්ෂවලද අදාළ වැටුප් වර්ධක ඉල්ලුම්කරුට ලැබී නැත. ඉල්ලුම්කරු ප්‍රධාන වෛද්‍ය නිලධාරිතුමිය මගින් කොළඹ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත පැ/05 දරන ලිපිය යවා ඇත. එම ලිපියේ දිනය 2007.09.17 වැනි දින වේ. පැ/05 ලිපියට පිළිතුරු නොලැබුණු බැවින් 2007.12.20 වැනි දිනැති (පැ/06) දරන ලිපියෙන්ද ලේඛකාධිකාරීගේ අවධානය යොමු කර ඇත.

05. කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) විසින් කොළඹ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී අමතන ලද 2010.04.06 වැනි දිනැති ලිපියේ දෙවෙනි ඡේදයේ මෙසේ සඳහන් වේ.

> "ඒ අනුව වැටුප් වර්ධක විලම්භනය කිරීම පිළිබඳව විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ ආයතන සංග්‍රහයේ නියමයන් නොසලකා හරිමින් පැමිණිලිකාර නිරංජන් උඩුමලගල මහතාගේ වැටුප් වර්ධක විලම්භනය කර ඇති බැවින්, 2007, 2008 සහ 2009 වර්ෂවල ඔහුගේ වැටුප් වර්ධක ලබා දී ඒ අනුව ඔහු ජ්‍යෙෂ්ඨත්වයේ පිහිටුවා කටයුතු කර ඒ බව මා වෙත දැන්වීමට කාරුණික වන ලෙස මෙයින් දන්වමි."
> (පැ/09)

06. පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂිදීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ, කාර්මික සම්බන්ධතා අංශයේ මිරිස්සගේ සේනක ශාන්ත කුමාර සහ කම්කරු නිලධාරි අත්හෙට්ටිගම ගමරාළගේ අනුෂ්ක ලසන්ත පියසේන යන නිලධාරීන් සාක්ෂි දී ඇත.

07. ශාන්ති කුමාර මහතා 2013.10.09 වැනි දින සාක්ෂි දෙමින් පවසා ඇත්තේ පැමිණිලිකරු විසින් 2008.11.24 වැනි දින **නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලයට** ඔහුගේ 2007 වසර ගෙවිය යුතු වැටුප් වර්ධක වගඋත්තරකාර පාර්ශ්වය යන කොළඹ විශ්ව විද්‍යාලය විසින් **විලම්භනය** කර ඇති බවට ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් කාර්මික සම්බන්ධතා විසින් විමර්ශනයක් සිදු කර ඇති බවයි.

08. කම්කරු සම්බන්ධතා අංශයට පැමිණිලිකරු සහ වගඋත්තරකාර පාර්ශ්වයේ නියෝජිතයින්ද කැඳවා විමර්ශනයක් කල බව ශාන්ත කුමාර මහතා පවසා ඇත. එම විමර්ශනයේදී උඩුමලගල මහතාගේ පැමිණිල්ල පැ/36 වශයෙන් කාර්මික අධිකරණයේදී පරීක්ෂණයේදී සලකුණු කරන ලදී. එම පරීක්ෂණය සඳහා එල්. එල්. වසන්ත පෙරේරා මහතා සහ නීතිඥ කෞෂල්‍යා දිසානායක මහත්මියත් විශ්ව විද්‍යාලය වෙනුවෙන් පෙනී සිටි බව සාක්ෂිකරු පවසා ඇත.

09. **ඉන් පසු 2009.10.02 වැනි දින පරීක්ෂණයට ඉල්ලුම්කරු පෙනී සිටියදී, විශ්ව විද්‍යාලය වෙනුවෙන් කිසිවෙකු පෙනී නොසිටි බවද ශාන්ත කුමාර මහතා පවසා ඇත.** පැ/09 ලේඛනය අනුව ඉල්ලුම්කරුගේ 2007, 2008 සහ 2009 යන වර්ෂවලට අදාළ වැටුප් වර්ධක විලම්භනය කර ඇති බැවින් එය නිවැරදි කරන ලෙස පැමිණිලිකරු ඉල්ලා ඇත.

පැ/38 අනුව 2007, 2008 සහ 2009 වර්ෂවල විලම්භනය කරන ලද වැටුප් වර්ධක යථා තත්ත්වයට පත් කිරීමට වගඋත්තරකාර පාර්ශ්වය කටයුතු කරමින් සිටින බව සාක්ෂිකරු පවසා ඇත.

පැ/39 අනුව උඩුමලගල මහතාගේ 2007, 2008 සහ 2009 වර්ෂවලට අදාළ වැටුප් වර්ධක ලබාදීමට කටයුතු කර ඇති බව වැඩ බලන ලේඛකාධිකාරී කම්කරු කොමසාරිස් (කම්කරු සබඳතා) වෙත දන්වා ඇතත්, එම සාක්ෂිකරු හෝ ලේඛකාධිකාරී බණ්ඩාර හෝ වෙනත් සාක්ෂිකරුවෙකු මේ පිළිබඳව බේරුම්කරණය ඉදිරියේ සාක්ෂි දී නැත.

10. එසේ වුවත් ලිඛිත දේශනයට ගොනු කර ඇති ව/15 වශයෙන් සලකුණු කරන වැඩ බලන ලේඛකාධිකාරී නානායක්කාර විසින් අත්සන් කරන ලද ලිපියේ පිටපතක සඳහන් වන්නේ "අභියාචනා මණ්ඩලයේ තීරණය පදනම් කරගෙන 2007, 2008 සහ 2009 වසරවල **වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධව විශ්ව විද්‍යාල පාලක සභාව එකඟ වී නොමැත**" යනුවෙනි. මෙයින් පෙනී යන්නේ ඇත්ත වශයෙන්ම 2010 අගෝස්තු මස වන විටද ඉල්ලුම්කරුට වැටුප් වර්ධක ගෙවා නැති බවයි.

එබැවින් මේ පරස්පර ප්‍රකාශ හමුවේ පෙනී යන්නේ ඉල්ලුම්කරුට අහිමි කරන ලද 2007, 2008 සහ 2009 වර්ෂවලට අදාළ වැටුප් වර්ධක ඉල්ලුම්කරුට **ආපසු ගෙවා නැති බවයි.**

11. පැමිණිලිකාර පාර්ශ්වයේ සාක්ෂි අවසන් කිරීමෙන් පසු 2014.03.03 වැනි දින වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරන ලදී. වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිය සඳහා කැඳවන ලද්දේ කොළඹ විශ්ව විද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි කේ. ධර්මදාස ඉන්ද්‍රකුමාර වාසුදේව මහතා ය.

සේවකයා තම රාජකාරි සම්බන්ධයෙන් දක්වන උද්‍යෝගය, කාර්යක්ෂමතාවය එදිනෙදා සේවය සඳහා පැමිණීම ආදී කරුණු සැලකිල්ලට ගෙන වැටුප් වර්ධක ගෙවන අවස්ථාවේදී අංශ ප්‍රධානි විසින් එය නිර්දේශ කලාට පසුව බවත්, වාසුදේව මහතා ආරම්භයේදීම පවසා ඇත.

12. ඉල්ලුම්කරුගේ 2007.01.01 වැටුප් වැඩිවීමට අදාළව සකස් කරන ලද ආකෘති පත්‍රය ව/17 වශයෙන්ද, 2008 සහ 2009 සඳහා වූ ආකෘති පත්‍ර පිළිවෙලින් ව/18 සහ ව/19 වශයෙන්ද සලකුණු කොට ගොනු කරන ලදී. හිඟ වැටුප් සහ අනිකුත් ප්‍රතිලාභ නොමැතිව අදාළ උසස්වීම් පෙරදාතම් කර තිබෙන බවද සාක්ෂිකරු පවසා ඇත. එහෙත් ඉල්ලුම්කරුගේ වැටුප් වර්ධක විලම්භනය කිරීම සම්බන්ධයෙන් ඔහුගේ මූලික සාක්ෂියෙහි සඳහනක් නැත.

13. මූලික සාක්ෂියෙන් පසු සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමට පැමිණිල්ලට අවස්ථාවක් ලබා දෙන ලදී. පැමිණිල්ලේ නීතිඥවරයාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් වර්ෂ 2007, 2008 සහ 2009 යන වර්ෂවල සාක්ෂිකරු කොළඹ විශ්ව විද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී වශයෙන් සේවය නොකල නිසා තමන් සාක්ෂි දෙන්නේ එම ලියවිලිවල සඳහන් වන විස්තර මත පමණක් බැව් පවසා ඇත. එහෙත් 2007, 2008 සහ 2009 වර්ෂවල වෛද්‍ය නිලධාරිනියක් සේවය කර ඇති බැව් ඔහු පිළිගෙන ඇත. ඉල්ලුම්කරුට 2007, 2008 සහ 2009 විලම්භනය කරන ලද වැටුප් ගෙවා ඇද්ද යන්න ඔහුගේ සාක්ෂියෙන් පැහැදිලි නොවේ.

14. එහෙත් සමහර ලේඛනවල අතින් ලියන ලද විස්තර පැහැදිලි නොමැති බවද ඔහු පවසා ඇත. බේරුම්කරු වශයෙන් සාක්ෂිකරුගෙන් විමසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් වාසුදේව මහතා පවසා ඇත්තේ වර්ෂ 2007, 2008 සහ 2009 වර්ෂවල උපයාගත් වැටුප් වර්ධක **ඉල්ලුම්කරුට නොදන්වා විලම්භනය කිරීමේ හේතුවෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුවී ඇති බවයි.** ව/17 හි වැටුප් වැඩිවීම එළඹෙන දිනය 2007.01.01 ලෙස සඳහන් වුවත්, එහි අනිකුත් විස්තර පැහැදිලි නැති බවද, වාසුදේව මහතා අවධාරණය කර ඇත. (2008 සහ 2009 වර්ෂවලට අදාළ විස්තර ඉතා අපැහැදිලි බැව් මටද පෙනී යයි.) මෙම ලියවිලිවල ඇති සටහන් කියවීමේ අපහසුතාවය නිසා වගඋත්තරකාර පාර්ශ්වයේ එකම සාක්ෂිකරු වන වෛද්‍ය වාසුදේවගෙන් වගඋත්තරකාර පාර්ශවය බලාපොරොත්තු වූ වාසිය එම පාර්ශවයට ලැබී නැත.

15. වාර්ෂික වැටුප් වැඩිවීම සඳහා උපයෝගී කර ගන්නා ලද ලේඛන 03 කී. එම ලේඛන ව/17, ව/18 සහ ව/19 වශයෙන් වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සලකුණු කරන ලදී. ව/17 හි "**වැටුප් වැඩිවීම එළඹෙන**" දිනය වශයෙන් "**2007.01.01**" ලෙස සඳහන් කර ඇත. එම ආකෘතියේ 4 වෙනි පිටුවේ "**වැටුප් වැඩිවීම නිර්දේශ කරන්නේද යන වග**" යටතේ ලියන ලද විස්තර කියවීම අපහසුය. ව/18 හි වර්ෂය යටතේ ද සඳහන් කර ඇත්තේ "**2007**" යනුවෙනි. ඒ අනුව ව/17 සහ ව/18 ලේඛන දෙකම අදාළ වන්නේ 2007 වසරටමය. මෙම ලේඛන දෙකෙහිම අතින් ලියන ලද තොරතුරු පැහැදිලි නැත. වර්ෂ 2008 සහ 2009 සම්බන්ධයෙන් ආකෘති විත්තියෙන් සලකුණු කර නැත. මෙම පරස්පර විරෝධී කරුණු පැහැදිලි කිරීමට කිසිම වැඩ බලන ලේඛකාධිකාරීවරයෙකු මෙම පරීක්ෂණය ඉදිරියේ සාක්ෂි දීමට වගඋත්තරකාර පාර්ශ්වයෙන් නිලධාරියෙකු කැඳවා නැත. වැටුප් ගෙවීම නතර කිරීම, අඩු කිරීම සහ විලම්භනය කිරීම පටලවාගෙන ඉල්ලුම්කරුට අගතියක් සිදු කර ඇත්තේ වැඩ බලන ලේඛකාධිකාරි වී. එල්. ආර්. සිල්වා සහ අනිකුත් ලේඛකාධිකාරීවරුන්ය. කරුණු පැහැදිලි කිරීමට මේ නිලධාරීන්ගෙන් කිසිවෙකු සාක්ෂි දීමට කැඳවා නැත. **වැටුප් වර්ධක විලම්භනය කිරීමේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ විධි විධාන** බරපතල දඬුවම්වලට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දී ඇති බලතල කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පවරා ඇත. මෙම පැවරීමට අදාළ විස්තර පැමිණිල්ලෙන් සලකුණු කරන ලද පැ/32, පැ/33, පැ/34 වන ලේඛනවල සඳහන් වේ.

16. පැ/33 අනුව වැටුප් වර්ධක නතර කිරීම අඩු කිරීම සහ විලම්භනය කිරීම යන දඬුවම් සම්බන්ධයෙන් පිළිවෙලින් 27:7:2, 27:7:3, 27:7:4 සහ 27:8 යන වගන්තිවල සඳහන් වේ.

7.4 වගන්තිය 4:1:2 වගන්ති අනුව බරපතල දඬුවමක් නියම කල හැකි වරදක් කර ඇති බවට පෙනී ගියහොත් 8 වෙනි ඡේදය යටතේ **මූලික විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ඒ ප්‍රශ්නය ආපසු යොමු කළ යුතුය.**

17. මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii කාණ්ඩයේ 24 වෙනි වගන්තියේ 24:3:10 උප වගන්තිය කෙරෙහි මාගේ අවධානය යොමු වී ඇත. විශ්ව විද්‍යාල මෙන්ම ව්‍යවස්ථාපිත මණ්ඩලයද රජයේ ආයතන සංග්‍රහය අනුගමනය කර ඇත.

18. රජයේ ආයතන සංග්‍රහයේ සුළු දඬුවම් සහ බරපතල දඬුවම් පැහැදිලි ලෙස වෙන් කර ඇති අතර, 24:3:10 උප වගන්තිය යටතේ නිලධාරියාගේ වැටුප් වර්ධක විලම්භනය කිරීම බරපතල දඬුවමක් ලෙස දක්වා ඇත. විශ්ව විද්‍යාලවල ලේඛකාධිකාරීවරුන් සහ අනෙකුත් ඉහළ නිලධාරීන් මහාචාර්යවරුන්ද මේ ආයතන සංග්‍රහයද කියවා තේරුම් ගන්නේ නම් සේවකයින්ට යුක්තිය හා සාධාරණය ඉටු කිරීමට ඔවුන්ට හැකිවනු ඇත. එහෙත් ආයතන සංග්‍රහයේ විධි විධානයන් අනුව එක් අවුරුද්දකට වැඩි නොවන කාලයකට වැටුප් වර්ධකයක් **අත්හිටුවීම** සහ එක් අවුරුද්දකට වැඩි නොවන කාලයකට වැටුප් වර්ධකයක් **නතර කිරීම** සුළු දඬුවම් ලෙස දක්වා ඇත. (රජයේ ආයතන සංග්‍රහයේ 24:2:4 සහ 24:2:5) මට පෙනී යන්නේ විශ්ව විද්‍යාලයේ බලධාරීන් විසින් මෙම සුළු දඬුවම් විලම්භනය කිරීමක් ලෙස සලකා ක්‍රියා කර ඇතත්, ඇත්ත වශයෙන් 2007, 2008 සහ 2009 යන වර්ෂ තුන සඳහා "විලම්භනය" කිරීමක් ලෙස ක්‍රියා කිරීම සාවද්‍ය බවයි.

19. මෙම බේරුම්කරණ නඩුවේ ප්‍රධානය නිකුත් කිරීමට පෙර ඉල්ලුම්කරු නිරංජන් උඩුමලගල මහතා හදිසියෙන්ම රෝගාතුර වී මිය ගොස් ඇති බැව් විශ්ව විද්‍යාලය සහ වෙනත් අනියම් මාර්ගවලින් බේරුම්කරුට දැන ගන්නට ලැබුණු බැවින්, ඔහුගේ නිත්‍යානුකූල උරුමකරුවන් 2014.08.14 වැනි දින බේරුම්කරණය ඉදිරියට කැඳවන ලදී. එදින ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ හේමන්තා

බාලසූරිය මහත්මිය සමග නීතිඥ අරුණ ලක්සිරි මහතා පෙනී සිටි අතර, වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ප්‍රියංකා වීරසූරිය මහත්මිය සමග නීතිඥ කෞෂල්‍යා දිසානායක මහත්මිය පෙනී සිටියාය.

20. එදින මිය ගිය ඉල්ලුම්කරුගේ නිත්‍යානුකූල බිරිඳ වන **රසිකා දර්ශනි හේවා උළුවත්තගේ** මහත්මිය පෙනී සිටිමින් ඇයට දරුවන් නොමැති බව ප්‍රකාශ කල අතර, සියළුම ලිපි ලේඛන සමග දිවුරුම් පෙත්සමක් ද විධිමත් ලෙස ඉදිරිපත් කලාය. වගඋත්තරකාර පාර්ශවයේ කිසිම හරස් ප්‍රශ්නයක් අසා නැත.

පසුව 2014.08.21 වැනි දින යොමුවේ සඳහන් 2007, 2008 සහ 2009 යන වර්ෂ සඳහා මිය ගිය නිරංජන් උඩුමලගල මහතාට ගෙවන ලද මුදල් ද සැලකිල්ලට ගෙන ගෙවිය යුතු වැටුප් පෙන්නුම් කෙරෙන කොළඹ විශව විද්‍යාලයේ මුල්‍ය අධිකාරී (වැටුප්) විසින් අත්සන් කරන ලද Y/01 සහ Y/02 නීතිඥ කෞෂල්‍යා දිසානායක මහත්මිය විසින් බේරුම්කරණයට ඉදිරිපත් කරන ලදී. මෙම ගෙවීම් සිදු කිරීමට විශ්ව විද්‍යාලය තීරණය කර ඇත්තේ ඉල්ලුම්කරු ඖෂධවේදී විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ පදනම මත බැව් නීතිඥවරිය පවසා ඇත. Y/01 සහ Y/02 ලේඛනය අනුව ඉල්ලුම්කරුට ගෙවිය යුතු හිඟ මුදල මෙසේය :

| | | |
|---|---|---|
| වර්ෂ 2007 වර්ෂයට ගෙවිය යුතු හිඟ මුදල | - රු. | 9,240.00 |
| වර්ෂ 2008 වර්ෂයට ගෙවිය යුතු හිඟ මුදල | - රු. | 9,780.00 |
| වර්ෂ 2009 වර්ෂයට ගෙවිය යුතු හිඟ මුදල | - රු. | 7,654.00 |
| එකතුව | - රු. | 26,674.00 |

21. මේ මුදල කොළඹ විශ්ව විද්‍යාලය විසින් නිරංජන් උඩුමලගල මහතාගේ නිත්‍යානුකූල බිරිඳ වන රසිකා දර්ශනි හේවා උළුවත්තගේ මහත්මියට මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කොට සති 02 ක් ඇතුළත ගෙවිය යුතු බව නිගමනය කරමි.

මෙම ප්‍රදානය යුක්තිසහගත සහ සාධාරණ බව මම නිගමය කරමි.

ටී. පියසෝම,
බේරුම්කරු.

2014.08.26

10 - 489

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.